**දශක තුනක් තිස්සේ උතුරේ පැවැති යුද්ධයේ අවසාන දින කිහිපය තුළදී රජයේ හමුදාවන්ට බාරවූ එල්.ටී.ටී.ඊ. ඉදිරි පෙළ සාමාජිකයන් අතර එම සංවිධානයේ දේශපාලන අංශයේ කාන්තා නායිකාව තමිළිනී ජෙයක්කුමාරන් ද විය. යුද ජයග්‍රහණයෙන් පසුව රජය ක්‍රියාත්මක කළ පුනරුත්ථාපන වැඩ පිළිවෙළ යටතේ නැවත සමාජ ගත කෙරුණු ඇය ඉන් වසර කිහිපයකට පසුව මහරගම පිළිකා රෝහලේදී ජීවිතක්ෂයට පත්වූයේ පිළිකා රෝගියෙකුවය. පිළිකා රෝගයට ගොදුරුව මරණය අභිමුව සිටියදී ඇය එල්.ටී.ටී.ඊ. සංවිධානය හා සම්බන්ධ සිය ක්‍රියාකාරකම් සහ බිහිසුණු අත්දැකීම් පිළිබඳ තබන ලද ලිඛිත සටහන් පසුව දෙමළ භාෂාවෙන් පොතක් ලෙස ප්‍රකාශයට පත් කෙරිණි. එහි ඇතුළත් කරුණු දෙමළ සමාජය තුළ මහත් විවාදයටද, බාහිර සමාජයේ මහත් අවධානයටද ලක්වීය.**

**අතිමහත් සමාජ පිරිවැයක් දරමින් එල්.ටී.ටී.ඊ. යුද සංවිධානය වැනසීමට රජයේ හමුදා සමත් වුවද, එම සංවිධානයේ නැඟීමට සහ පැවැත්මට බලපෑ හේතු නැසීමට රජය මෙතෙක් සමත්වී නැත. උතුරේ දෙමළ ජාතිවාදයද, නැඟෙනහිර මුස්ලිම් ජාතිවාදයද, දකුණේ සිංහල ජාතිවාදයද මේ මොහොතේ නව වටයකින් හිස ඔසවමින් සාමකාමී පුරවැසි සමාජයට සන්නිවේදනය කරන පණිවිඩයද බෙහෙවින් භයානකය. එවැනි පසුබිමක මද අස්වැසිල්ලක් භුක්තිවිඳිමින් සිටින දැනුම්වත් සිංහල පුරවැසි සමාජයට තමිළිනීගේ මරණාසන්න ස්මරණය මගින් ලබාදෙන පණිවිඩයේ ඇති සුවිශේෂීත්වය සළකා එහි සිංහල පරිවර්තනය කොටස් වශයෙන් ඔබ වෙත ගෙනඑන්නෙමු.**

**තමිළිනී දෙමළ බසින් තැබූ සටහන් සිංහලයට නැඟූ ආචාර්ය ස්වාමිනාදන් විමල් සහ ඒ සඳහා අවශ්‍ය සෙසු සම්පත්දායකත්වය සැපයූ සිනමාවේදී ධර්මසිරි බණ්ඩාරනායක දෙපළට මෙහිදී අපගේ විශේෂ ස්තුතිය පිරිනමමු.**

සන්නසට සකස් කරන්නේ - ශ්‍රීලාල් සෙනෙවිරත්න



# තමිළිනීගේ කතාව 15

## නායකතුමාගේ සිහින බළඇණිය වූ දිවි බලඇණිය

1992 සහ 1993 යන කාල පරිච්ඡේදයන්හි දී මම සහභාගි වූ රැස්වීම්වලදී කොටි සංවිධානය වෙත ජනතාව ප්‍රශ්න රැසක්ම එල්ල කළහ. 'ඇයි උතුරෙන් මුස්ලිම් ජනතාව එළවලා දැම්මේ? ඇයි අනෙකුත් කණ්ඩායම්වල සටන්කාමීන්ව කොටි සංවිධානය විසින් විනාශ කළේ?' වැනි ප්‍රශ්න ඉදිරියේ තරුණ වියේ සටන්කාමී අපි නිරුත්තරව සිටියෙමු. ඇත්තෙන්ම එම ප්‍රශ්න සඳහා නිසි පැහැදිලි පිළිතුරු අපි එම මොහොතේ නොදැන සිටියෙමු.

දේශපාලන සිදුවීම් අඛණ්ඩව නිරීක්ෂණය කරන අය ලෙසින් ද, විමුක්ති අරගලයේ මුළු බරම දැරූ අය ලෙසින් ද ජනතාව උන්හ. ඔවුන් වෙනුවෙන් සටන් කරන අපි ජනතාවට විශ්වාසවන්තව සිටිය යුතු වෙමු. ජනතාවගේ සිත් තුළ තෘප්තියක් ඇතිවන අයුරින් අපගේ ක්‍රියාකාරකම් සිදුවිය යුතුය යන ආකල්පය සටන්කාමීන් තුළ තිබුණු බව සත්‍යයකි. එහෙත් සංවිධානයෙහි සමහර ක්‍රියාකාරකම් තුළින් ජනතාවට ගැටළු ඇති කළ අවස්ථාවන් අරගල කරන කාලයකදී වැළැක්විය නොහැකි සිදුවීම් සහ කැප කිරීම් ලෙසින් සළකන ලදි.

විමුක්ති කොටින් අනෙකුත් සංවිධානවල සාමාජිකයන්ව මරා දැමීම පිළිබඳව කොටි සංවිධානයේ සාමාජිකයන් වෙත කිසිම කාලයක නිවැරදි පැහැදිලි කිරීමක් කෙරුණේ නොමැත. එයට වෙනස්ව 'විකල්ප සංවිධානවල වැරදි ක්‍රියාමාර්ග හේතුවෙන් විමුක්ති කොටි සංවිධානය විසින් ඒවා තහනම් කරන ලදි' යන අදහස සංවිධානය තුළ වර්ධනය කර තිබුණි. අලුත් සටන්කාමී සහෝදර සහෝදරියන් නැතහොත් ඥාතීන් කිසිවෙකු වෙනත් සංවිධානවල සිටින්නේද යන්න අනිවාර්යෙන්ම විස්තර කළ යුතුය. දෙදහට පසුව එන කාලය තුළදී වෙනත් සංවිධානවල සිට මරණයට පත්වූ සමහරුන්ව විමුක්ති කොටින්ගේ මහවිරු ලැයිස්තුවට ඇතුළත් කොට ගෙන තිබුණි. මා දන්නා අයුරින් කොක්කාවිල් ප්‍රදේශයෙහි දී හමුදාව සමඟ සිදු කෙරුණු ගැටුමෙහිදී ජීවිතක්ෂයට පත් උෂා නම් වූ. ඊ.පී.ආර්.එල්.එෆ්. සංවිධානයට අයත් සටන්කාමී සහෝදරිය එසේ මහවිරු ලැයිස්තුවට ඇතුළත් කර ගන්නා ලද එක් අයෙකි. ඇය පිළිබඳව අමතර තොරතුරු හෝ කුමණ වර්ෂයෙහිදී එය සිදුවිණිද යන්න ආදිය මම නොදනිමි.

2008 වසරේ දී සාම සාකච්ඡා සඳහා වන උත්සාහයේ දී මුස්ලිම් ජනයාගේ දේශපාලන නායකයන් සමඟ කොටි සංවිධානය පැවැත්වූ සාකච්ඡා සහ ගිවිසුම් ද එයට පසුව මුස්ලිම් ජනතාව තම උපන් බිම කරා නැවත පැමිණීමද සිදුවිය. මන්නාරම දිස්ත්‍රික්කයේ කොටි පාලන ප්‍රදේශ ලෙසින් පැවැති මුලංකාවිල්, නච්චිකුඩා සහ මුලතිව් දිස්ත්‍රික්කයෙහි මුල්ලවලෙ, නීරාවිප්පිට්ටි ද යාපනයෙහි අයින්දු සන්ධි ප්‍රදේශයෙහි ද මුස්ලිම් ජනතාව හමුවීමේ අවස්ථාවන් මට ලැබුණි. මුහුද සහ මහ පොළොව විශ්වාස කරගෙන ජීවත් වූ සාමාන්‍ය ජීවන තත්ත්වයක් සහිත වූ එම ජනතාව හමුවූ අවස්ථාවල මගේ හිතේ ඇති වූයේ මහත් වූ වැරදිකාරී බව පිළිබඳ හැඟීමකි. මර්ධනයට එරෙහිව සටන් කරන බවට පැවසූ අපේ ව්‍යාපාරය මෙම අහිංසක ජනයාගේ ජීවන අයිතිය මර්ධනය කිරීම සාධාරණය යන්න මගේ හදවතට කිසිසේත්ම පිළිගත නොහැකි විය. 1994 වසරේ අවසාන කාලයේ විශාල ලෙසින් සංවිධානයේ බළ සේනා ඒකාබද්ධ කර ප්‍රබල ප්‍රහාරයක් සඳහා පුහුණුවීම් සිදු කළේය. දේශපාලන අංශයේ සිටි සටන්කාමීන් ද ඒ සඳහා යැවූහ. කාන්තා බළ සේනාව සඳහා පුහුණුවීම් සිදු කළේ අරියාලමෛණියම් තෝට්ටම් හිදීය. මුහුදු මාර්ගයේ බෝට්ටුවල නිශ්චිත දුරක් ගමන් කර ප්‍රහාරය එල්ල කළ යුතු බවට පවසා තිබුණි. තුවාල ලැබූවන් මුහුදු මාර්ගයෙන්ම රැගෙන ආ යුතුය. එහෙයින් මෙය මහත් අභියෝගාත්මක ප්‍රහාරයක් වනු ඇති බවට මත පළ විය.

මණ්ඩෛතිවු හමුදා කඳවුර වෙත එල්ල කරන ප්‍රහාරය සඳහා වන අවසන් අදියරේ සූදානම්වීම් අවසන් වූ පසුව අපේ බළඇණි රැගෙන යාමට වාහන පැමිණියේ ය. වේලාව රාත්‍රී හතට පමණ ඇත. වාහන වලට නැංවීම සඳහා බළඇණි සූදානම් කෙරුණි. ක්ෂණිකව ලැබුණු තොරතුරකින් කියවුණේ එම ප්‍රහාරාත්මක මෙහෙයුම අතහැර දමා ඇති බවය. අපව නැවතත් අපගේ ස්ථානවලට යැවිණි. එම ප්‍රහාරය නතර කිරීමට නිවැරදි හේතුව අපට දැනුම් දුන්නේ නැත. එහෙත් හමුදාවට ඒ පිළිබඳ ඔත්තුව ලැබී ඇතැයි යන්න දැන ගැනීමට ලැබුණි. අපේ කණ්ඩායම නැවතත් දේශපාලන අංශයට යැවීය. එයට පසුව 1995 ආරම්භක කාල පරිච්ඡේදයෙහි දී වැලිඔය ප්‍රදේශයේ කෝකිලායි, කොක්කුන්තොටඩුවායි, කරුනාට්ටුක්කේණි, ඩොලර් ෆාම්, කෙන්ට් ෆාම්, යන හමුදා කඳවුරු පහක් මත එකම මොහොතකදී විශාල ප්‍රහාරයක් එල්ල කළේය. මෙම මෙහෙයුම සඳහා නායකතුමාගේ සෘජු දැඩි අධීක්ෂණය යටතේ බිහි කළ දිවි බළඇණි අධික ලෙසින් යොදාගත්හ. ඔවුන්ව සංවිධානයේ අනෙක් සාමාජිකයන්ට පවා දැකිය හැකි නොවේ. ඔවුන්ට පළමු පස්වසර තුළ නිවාඩුවක් නොලැබෙන අතර, වසර ගණනාවක් අඛණ්ඩව දුෂ්කර පුහුණුවීම් සහ හමුදාමය තාක්ෂණයන් උගන්වනු ලැබේ. එම බළඇණියේ කාන්තා සාමාජිකාවන් තම කෙස් වැටිය ඉතාමත් කෙටි වන්නට කපා ගත යුතු අතර, ඔවුන්ට කරාටේ, මල්ලව පොර, බොක්ෂිං ආදී බොහෝ ස්වයං ආරක්ෂක කලාවන් ද පුහුණු කර තිබිණ. මගේ නැඟණිය ද කටයුතු කළේ එම අංශයෙහිය.

සංවිධානය බලාපොරොත්තු වූ අයුරින් එම ප්‍රහාර සැළැස්ම ජයග්‍රහණය කළේ නැත. ඒ වෙනුවට සංවිධානයට මහත් විශාල අහිමිවීම් සිදුවිය. නායකතුමාගේ සිහින බළඇණිය වූ දිවි බළඇණිය මහත් හානියකට මුහුණ දුන්නේය. දෙසීයකටත් වඩා අධික සටන්කාමී සහෝදර සහෝදරියෝ ජීවිතක්ෂයට පත්වූහ. විකෘතිව තිබූ ඔවුන්ගේ මළ සිරුරු ලංකා ආණ්ඩුව ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ මාර්ගයෙන් කොටි සංවිධානය වෙත භාර දී තිබුණි.

එවක මම වඩමරච්චි ප්‍රදේශයේ වැඩ කරමින් සිටියෙමි. දිවි බළඇණිය සම්බන්ධ වූ විශාල ප්‍රහාරාත්මක ක්‍රියාන්විතය පරාජයට පත්වූ බවත්, කාන්තා සටන්කාමීන් ලෙස විශාල සංඛ්‍යාවක් ජීවිතක්ෂයට පත්වූ බවත් අපට ආරංචි විය. මෙම මෙහෙයුමට මගේ නැඟණියත් සහභාගි වූවාද නැත්ද යන්න පිළිබඳව නොදැන සිටීමෙන්, වේදනාවට පත්වුවද මම නිහඬව මගේ වැඩකටයුතුවල යෙදී උන්නෙමි.

මියගිය අයගේ පවුල්වලට දැනුම් දීම සඳහා නම් ලැයිස්තු වඩමාරච්චි කොට්ඨාශයටත් එවා තිබුණි. එය සිතන විටත් ක්ලාන්තය හැඳී වැටෙන සිද්ධියකි. අවුරුදු පහක් තිස්සේ තම



36 වන පිටට

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com